# කම්මැලි පූසා



හියන්සා උමින්දි

# පිළිගැන්වීම

මට හරි වැරදි පෙන්වා දෙමින්

නිතර නිවැරදි ගුරු හරුකම් කියා දෙමින්

යා යුතු මග පෙන්වා දෙන

මාගේ ගුරුමෑණියන් වන

සමන්මලී ගුරු මෑණියන්ට

මෙම කෘතිය පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥසම්පන්න දැනුමෙන් යුත් බහුවිද කුසලතාවන්ගෙන් සුපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවන්ගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුලින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැන්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණයට සහජයෙන් උරුමකරගත් මහමාය දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස්ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබුණු සුවිශේෂ ජයග්‍රහණය ක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසැල තුල ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය  මෙවර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් දරුවනට ගැලෙපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් ” වැඩසටහන හදුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකාඅධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසැල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි

2023. සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසැල විසින් සංවිධානය කල “දිවිය දිනන විද්‍යුත් පොතක් ” වැඩසටහනට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙමෙ කෘතිය තුලින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රර්ථනා කරමු

මෙමෙ වැඩසටහන වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසැල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උපකාර කල සැමට ගෞරව පූර්වක ස්තුතිය මේයින් පුදකරමි

ගරු විදුහල්පති


ශෂිකලා සෙනාධීර

මහමායා බාලිකා විද්‍යාලය -මහනුවර

2023.11.01

සුන්දර ගම්මානයක පුංචි නිවසක සදුන් කියලා පොඩි පිරිමි ළමයෙක් ජීවත් වුණා.

එයාට පූස් පැටියෙක් හිටියා. ඌගේ නම බ්‍රවුනි.



බ්‍රවුනි හරි කම්මැලි පූස් පැටියෙක්. එයාගේ වැඩේම පුටුවට වෙලා ගුලි වෙලා නිදා ගන්න එක.



දිනක් මොර සූරන වැස්සක් වැස්සා. සඳුන් ගෙදර ආවේ හොඳටම තෙමීගෙන.



පහුවදා සඳුන්ට හොඳටම උණ. පාසල් ගියෙත් නෑ.

සඳුන්ගේ අම්මා උදෙන්ම සඳුන්ට කිරි වීදුරුවක් හදා දුන්නා ඔක්කොම බොන්න කියලා.



සඳුන් බිව්වේ උගුරු දෙකයි. එයාට බොන්න බැරි නිසා එයා අම්මාට හොරෙන් කිරි වීදුරුවම බ්‍රවුනිගේ කෝප්පයට දැම්මා.



ගුලි වෙලා නිදා ගෙන සිටිය බ්‍රවුනි මේක දැක්කා.

හිමිහිට පුටුවෙන් බැහැලා ගිහින් කිරි උගුරක් බීලා ආයමත් පුටුවට වෙලා නිදා ගත්තා.



එහා ගෙදර තිලිණිගේ පූස් පැටියා ලැසී සඳුන්ගේ ගෙදර නිතර එනවා.

එදත් ඌ පුරුදු විදිහටම සඳුන්ගේ ගෙදරට ආවා.



කිරි කෝප්පය දැක්ක ගමන් හිමින් හිමින් එතනට ළං වුණා. ටික ටික බොන්න පටන් ගත්තා.



බ්‍රවුනි නින්දෙන් ඇහැරුණා. එයා දැක්කා ලැසී එයාගේ කිරි කෝප්පය බොනවා. එයාට හොදටම තරහා ගියා. බ්‍රවුනි ගොරවාගෙන ලැසී හිටපු තැනට පැන්නා.



ලැසී බය වෙලා දුවන්න ගිය පාර එයාගෙ කකුල වැදිලා කිරි කෝප්පය පෙරලුණා.



මේ ශබ්දය ඇසුණ අම්මා ඇවිත් බැලුවා. අම්මා දැක්කා වෙලා තියෙන දේ.



අම්මාට හොඳටම තරහා ගියා. අම්මා සඳුන්ට හොඳටම දොස් කීවා. සඳුන්ට හරිම දුකයි. ඇඬෙන්නත් ආවා.



කම්මැලි බවුනි නිසා සිදු වුණු දෙයක්.



# <u>පසුවදන</u>

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔනැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදීග ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් යග පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකිග මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මහපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම වව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමිග

දිව්‍යය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබව ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු...

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01